# රහසක වගතුග

රහස (secret) යන වචනය සමාජමය මෙන්ම දාර්ශනික වටිනාකමක් ද සහිත පදයකි. පොදු සමාජයේ රහස් සඳහා ගෞරවනීය තත්ත්වයක් නැති අතර බොහෝ අය එය හඳුනාගෙන ඇත්තේ යමක් හොරෙන් කිරීම හෝ සඟවා ගෙන තබා ගැනීම (furtiveness) යනුවෙනි. එබැවින්ම එය පහත් ක්‍රියාවක් ලෙස පිළිකුලට ද භාජනය වේ. එතෙකුදු වුවත් යම් යම් කරුණු රහසේ තබා ගැනීම මානව අන්තර්ක්‍රියාවලීන්හි ඉවතලිය නොහැකි දෙයකි. බෞද්ධ සන්දර්භයේ දී රහස සම්බන්ධ වැදගත්ම වන අදහස වන්නේ බුදුන් වහන්සේ **අරහ** (න - රහ) යනුවෙන් හඳින්වීමයි. එහි අදහස වන්නේ කිසිදු රහසක් නැති යන්නයි. රාග ද්වේෂ මෝහ මුළුමණින් ක්ෂය කළ එසේම අලෞකික චර්යාවකින් හෙබි අධ්‍යාත්මික චරණයේ අග්‍රභාවයට පත් උතුමන් වහන්සේ නමක් වන බුදුන් වහන්සේ හැඳින්වීමට එබඳු පදයක් යෙදීමේ යුක්තිය ඉතා පැහැදිලිය. එහෙත් ලෞකික චරණයක් සහිත පුහුදුන් සමාජයක රහස් සංසිද්ධීන් පැවතීම නො වැලැක්විය හැක්කකි. එහෙයින්ම සෙසු සමාජ ආගමික දාර්ශනික සන්දර්භයන්හි මෙන්ම බුදුදහමේ ද රහස පිළිබඳව විවරණය වන අදහසක් විද්‍යමාන වේ. මෙම ලිපියේ අරමුණ වන්නේ එකී රහස පිළිබඳ බෞද්ධ අදහස විවරණය කිරීමයි.

රහස යන පදයෙන් විවරණය වන අරුත පළ කිරීමට සිංහල පොත පතෙහි **ගුප්ත, ගුහ්‍ය, ගුය්හ, ගූඪ, රහසිගත, අප්‍රකට, අප්‍රකාශිත, රහස්‍ය** යන පද පමණකි නොව සමානාර්ථයේ යෙදෙන සතර කන් මන්ත්‍රණය වැනි  අපර නාමයෝ ද වැකි  ද යෙදේ. **රහ** - **රාහසෙය්‍ය** - **මන්ත** - **ගොපනීය** - **ජන්න** යනාදි පද පාලියේ රහස හැඳින්වීම සඳහා පර්යාය පද වශයෙන් භාවිත වේ. විවිධ ශබ්දකෝෂවල රහස යන්න විවිධ නයින් අරුත් ගන්වා ඇත. **ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි** රහස යන්න විවරණය කොට ඇත්තේ සැඟවිය යුත්ත, අප්‍රකට කාරණය, ජනයා නැති තැන යනුවෙනි.[1] බුද්ධදත්ත නාහිමියන් පාලි සිංහල පාලි ශබ්ද කෝෂයෙහි **රහ** යන පදයට **විජන ස්ථානය, විවෙකස්ථානය, රහස** යනුවෙන් අරුත් දී ඇත.[2] එහිම රහස යන්නට අන්‍යයෙකුට නො දැක්විය යුත්ත යන අරුත් ද දී ඇත.[3] රහසේ කරන කතා බහ රහස යන්නෙන් ගැනෙන බව **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය** කියයි.[4] **පොල්වත්තේ බුද්ධදත්ත** හිමියන් **රහො** යන්නට රහස් ලෙස හා රහසින් යන අරුත් සපයා ඇති අතර **රහොගත** යන්නට තනිවූ, විවේකයට පත්, රහසිගත වූ යන අරුත් තුන දී ඇත.[5] සංස්කෘත ශබ්දකෝෂවල අනෙක් අරුත්වලට අමතරව **තනිකම, මුඩු වූ බිම, තනි වූ, පෞද්ගලික** යනාර්ථ ද රහස යන්නෙන් අදහස් වන බව දක්වා තිබේ.[6] පාලි සූත්‍රාන්ත දේශනාවල රහස යන පදය නො යෙදේ. **රහො, රහ, රහොගත** යන පද ඒ වෙනුවට යෙදේ. ඉන් අදහස් වන්නේ හුදෙකලා බවට පත් නැතහොත් තනිවම යන අදහසයි.

මානවයාගේ ආරම්භය පිළිබඳව කතාන්තර සමඟ ද රහස සම්බන්ධ වන කිව යුතුය. ලෝකයේ ප්‍රභවය ගැන විවරණයක් ලෙස පැවසෙන **දීඝනිකායේ** අග්ගඤ්ඤ සූත්‍රයේ රහසේ මිනිසුන් ආහාරපාන රැස් කළ බවටත් රහසේ ලිංගික කටයුතු කිරීම සඳහා ගෙවල් ඉදි කළ බවටත් සඳහන් දෙකක් ඇත. ලෝකය අදෘශ්‍යමාන දෙවියෙකුගේ නිර්මාණයක් බව පවසන වෙනත් ආගම් හා දර්ශනවල ද ලෝකයේ ප්‍රභවය හා විකාසය පිළිබඳ විවරණයන්හි රහස්‍ය අප්‍රකට මූලාරම්භයක් ගැන කියැවේ. කෙසේ වුවත් අප වෙසෙන

ලෝකයේ රහසක සාමාජික වටිනාකමක් ඇත. ලෝකයේ පැවැත්ම විෂයෙහි සැඟවිය යුතු දේවල් ඇත. යුදමය රහස් ව්‍යාපාරික රහස් යනාදිය මීට නිදසුන්ය. මේවා අන්‍යයන්ගෙන් සඟවා තබා ගනු ලබන්නේ ඒවායෙහි වටිනාකම් සුරක්ෂිත කිරීම සඳහා මෙන්ම ප්‍රකට වීමෙන් වන හානිය අවම කර ගැනීම සඳහාය. පරිගණක විද්‍යාවෙහි සහ බැංකු ගණුදෙනුවල දී රහස් අංකයක් භාවිත කිරීම මෙයට නිදසුනකි. පෞද්ගලිකත්වයක් මෙන්ම පෞද්ගලික ක්‍රියාකාරකම් සෑම මිනිසෙකුටම අවශ්‍ය වේ. විවාහ ජීවිතයේ දී අඹු සැමියන් විසින් පවත්වාගෙන යනු ලබන ලිංගික රහස් යනාදිය රහසිගතභාවය සාමාජීය උවමනාවක් බව තහවුරු කෙරේ. මෙම රහසිගත දේවල් පිළිබඳ සෙවීමට අනෙකෙකු උත්සුක විය යුතු නොවේ. එය ශිෂ්ට සම්පන්න ක්‍රියාවක් නොවන බැවිනි. ඇතැම් නුපුහුණු මාධ්‍යවේදීන් යම් යම් පුද්ගලයන්ගෙන් පොදු වටිනාකමක් නැති පෞද්ගලික රහස් හෙළි කිරීමට දරණ වෑයම් ඇතැම් විට මාධ්‍ය ක්ෂේත්‍රයේ දක්නා ලැබෙන අතර එය ආචාරශීලී බුද්ධිමත් මිනිසුන්ගේ පිළිකුලට භාජනය වන අවස්ථා ඔබ දැක ඇත. මේ නිසා සාමාජීය රහස් පිළිබඳ බුදුදහමේ දැක්මක් ඇත. බුදුදහම මිනිස් සදාචාරය ඉහලින්ම අගයන දහමකි. එතෙකුදු වුවත් එහි මෙකී පොදු සමාජයේ සංසරණය වන රහස් හෙළා දැක නැත. සමාජයේ ක්‍රියාකාරකම් පිළිබඳ බෞද්ධ දැක්ම මනාව පැහැදිලි වන්නේ ජාතක කථා මගිනි. මනුෂ්‍ය අධ්‍යාත්මය විවෘත සහ ගුප්ත යන චරිත ලක්ෂණ දෙකෙන්ම යුක්ත වන බව ජාතකකථාවල පිළිගනී. ජාතක පොතෙහි **අසාතමන්ත ජාතකය**[7] මෙයට කදිම නිදසුනකි. ස්ත්‍රීත්වය තුළ තාන්න මාන්න නම්බු නාම ඉක්මාවා ගිය ගුප්තමය අධ්‍යාත්මයක් පවතී. එය පොත පත හැදෑරීමෙන් ඉගෙනගත හැක්කක් නොවේ. දිසාපාමොක් ඇදුරුතුමා වෙත සිප් සතර හැදෑරීම සඳහා පියා විසින් යවන ලද පුත්‍රයෙකු සිප් සතර නිමවා ආපසු පැමිණි කල පියා විසින් පුත්‍රයාගෙන් අසනු ලබන්නේ ඔබ **අසාත මන්ත්‍රය** උගත්තේහි ද යන්නයි. නැති පියාණෙනියි පිළිතුරු දුන් විට පියා විසින් නැවතත් තම පුතු එය ඉගෙන ගෙන පැමිණෙන ලෙස නියම කොට ආපසු පිටත් කරනු ලබයි. ලෝකයේ පසක් කළයුතු රහස් සමුදායක් පවතින බව එයින් ගම්‍ය වේ. **උම්මග්ග ජාතක**යේ බෝසතාණන් වහන්සේ රහසක් නම් එය කිය යුත්තේ කෙසේ දැයි පෙන්වා දෙයි. බුදුදහම ලෝකයෙහි ගුඪ අගුඪ සියලු සමාජ චරණයන් විෂයෙහි වලංගු නැත. ඇතැම් කරුණු පිළිබඳව එහි නිහඬ පිළිවෙතක් රකී. එම නිසා බුදුදහමේ දාර්ශනික ප්‍රස්තුතයන් විග්‍රහ කරන ආකාරය සලකා පොදු සමාජ යථාර්ථයන් අර්ථ ගැන්වීමට උත්සාහ කිරීම දැනුවත්ව කළ යුත්තකි.

## රහස් රැකගැනීම

රහසක් රැක ගැනීම ලෙහෙසි පහසු ක්‍රියාවක් නොවේ. රහසක් රහසක් ලෙස රැක ගැනීමට නම් එය දතයුත්තේ එම රහසේ හිමිකරුවා පමණකි. තවත් විධියකින් කිවහොත් අනෙකෙකුගේ රහසක් අනෙකෙකු විසින් සලකනු ලබන්නේ අනෙකෙකු සතු මුදල් මෙනි. අනෙකා ලඟ ඇති මුදල්වලින් ඔබට ප්‍රයෝජනයක් නැත. එබැවින් එය රැකදීමට මුළුමණින්ම කැපවීම විශ්වාස කළ නො හැක්කකි. රහස සැබැවින්ම සරම්ප රෝගය වැනිය. ශීඝ්‍රයෙන් පැතිරෙන අතර කැලැල් ඉතිරි වේ. රහසක් කන් හයකට ගියහොත් එය විනාශ වන බව (**ෂඩ්කර්ණො භිද්‍යතෙ මන්ත්‍රඃ**) සංස්කෘතයෙහි ප්‍රකට කියමනක් වේ.

**මිළින්දපඤ්හය** නම් කෘතියෙහි රහස් මන්ත්‍රණ පිළිබඳ වැදගත් කරුණු කිහිපයක් සාකච්ඡා කොට ඇත. එහි දී මිළිඳු රජු නාගසේන හිමියන්ට යෝජනා කරනුයේ රහසක් නො කීමට හේතුවන කරුණු නැතහොත් දෝෂ අටෙන් තමා විනිර්මුක්ත කෙනෙකු බවයි. එබැවින් තමා ලෝකයේ සිටින රහස් කීමට සුදුස්සන්ගෙන් කෙනෙකු (**මන්තසහාය**) බවයි.[8] **මිළින්දපඤ්හ**යෙහි හමුවන මෙකී මිළිඳු රජු ථේරවාදී මහායාන සම්ප්‍රදායන් විසින් පිළිගනු ලබනුයේ ඉතිහාසයෙහි හමුවන අද්විතීය ප්‍රඥා පාටවයකින් හෙබි එකම ගිහියා වශයෙනි. බෞද්ධ භික්ෂූන්ට සාකච්ඡාවෙහි හා සම්මන්ත්‍රණයෙහි දී අසනු ලැබූ ප්‍රශ්නවලට පිළිතුරු දීමට මෙතරම් අපහසු වූ වෙනත් ගිහියෙකු ගැන බෞද්ධ සාහිත්‍යයෙහි වෙනත් කිසිදු තැනක සඳහන් නොවේ. නාගසේන හිමියන් සමඟ සාකච්ඡාවක නිරත වී සිටි මෙම රජතුමා විසින් රහස් නොකිය යුතු ස්ථාන අටක් ගැන සඳහන් කරයි. එනම්

1. විෂම ස්ථානයෙහි (විසමට්ඨානෙ)
2. බිය සහිත ස්ථානයෙහි (සභයෙ)
3. සුළං අධික ස්ථානයෙහි (අතිවාතට්ඨානෙ)
4. මුවහ වූ ස්ථානයෙහි (පටිච්ඡන්නට්ඨානෙ)
5. දේවස්ථානයෙහි (දෙවට්ඨානෙ)
6. මාර්ගයෙහි (පන්ථෙ)
7. යුද්ධ භූමියෙහි (සංගාමෙ)
8. නාන තොටුපලෙහි (උදකතිත්ථෙ)[9]

මෙම ස්ථානවල රහස් නොකීමට හේතු රාශියක් ඇත. විෂම සංකීර්ණ තැන්වල යමක රහ්‍යභාවය රැකගැනීමට ප්‍රමාණවත් පරිසරයක් නිර්මාණය නොවේ. මිළිඳු රජු නාගසේන හිමියන් සමඟ සිදුකිරීමට යෝජිත ස්ථානය ජනශූන්‍ය ප්‍රවිවික්ත අරණ්‍යගත යථෝක්ත **අට්ඨංගදෝෂ විනිර්මුක්ත** ශ්‍රමණ සාරූප්‍ය ස්ථානයක් විය යුතු බව සඳහන් කරනුයේ එහෙයිනි. (**සුඤ්ඤෙ ඔකාසෙ පවිවිත්තෙ අරඤ්ඤෙ අට්ඨංගුපෙතෙ සමණසාරුප්පෙ**). මෙම ස්ථානවල රහස් කථා නො පැවැත්විය යුත්තේ කවර හෙයින්ද?

**විෂම ස්ථාන** සංයමයෙන් යුක්තව වැඩක් කළ නො හැකිය. එබැවින් යම් යම් දේ කථා කරන්නන් ද විෂම ස්ථානවලදී විෂම බවට පැමිණේ. එබඳු තැන්වල වික්ෂිප්තව කියනු ලබන දේවල්වල රහස්‍යභාවය ද වැනසේ. **බිය සහිත ස්ථාන**වල මනස චංචල බැවින් එහි වැදගත්කම නො වැදගත්කම මනාව නොසලකනු ලැබේ. එබැවින් එහි රහස් කථා නොකළ යුතුය. **දැඩි සංළං ඇති ස්ථාන**වල කියන දේ අපැහැදිලි බැවින් රහස් කථා කීම භයානකය. **පිළිසන් තැන හෙවත් වැසුණු තැන්**වල රහස් කථා නොකළ යුත්තේ රහස අසනු කැමති අනෙකෙකු එහි සැඟවී සිටිය හැකි හෙයිනි. **දේවස්ථාන**වල කියන ලද දේ බැරෑරුම් බවට යේ. එසේම ආගමික භක්තිය රහසක් කඩවීමට බලපෑ හැකිය. **මර්ගයෙහි** යන එන අතර රහසක් පමණක් නොව වැදගත් හා තීරණාත්මක කිසිදු දෙයක් සාකච්ඡා නොකළ යුත්තේ ඒවා හුදු හිස් ප්‍රලාප වීමේ සම්භාවිතාව වැඩි බැවිනි. **සංග්‍රාම භූමිය** යනු බිහිසුණු තැනකි. නිබඳ සිත සසල වේ. එබඳු තැන්වලද රහස් නො රැකේ. **නාන තොටුපලේ** දී කියනු ලබන දේ වහා ප්‍රකට වේ. එබැවින් මෙබඳු ස්ථාන රහස් කථා කිරීම සඳහා බුද්ධිමත් පුද්ගලයෝ යොදා නො ගනිති.

තවද පුද්ගලයන් නව දෙනෙකු සමඟ රහස් මන්ත්‍රණ නොකළ යුතුය.

1. රාගචරිතයා
2. ද්වේෂ චරිතයා
3. මෝහ චරිතයා
6. ස්ත්‍රී ධූර්තයා
7. සුරා සොඬ තැනැත්තා
8. පණ්ඩකයා

4. බියගුළු පුද්ගලයා 9. ළදරුවන් යන අයයි.[10]
5. ආමිෂ ගරුකයා

ලෝකයේ රාගය බහුල මිනිසුන්ගේ පාවාදීම් අතිප්‍රබලය. එබැවින් රහස්‍ය දේ ඔහුගෙන් හෙළිවීමේ ඇති ඉඩකඩ වැඩිය. ද්වේෂ සහගත පුද්ගලයෝ පළිගැනීම් වශයෙන් රහස් හෙළි කරති. මෝහ මූලික මිනිසාට මෝඩකම නිසා නිවැරදි තීන්දු තීරණ ගැනීම කළ නොහැකි වේ. එම නිසාම මුග්ධභාවය ඉස්මතු වී රහස හෙළි කරයි. වහා යම් යම් හේතු නිසා බියට පත්වන පුද්ගලයෝ ද බිය නිසාම තමාට වන හානියෙන් ආරක්ෂා වීම් වශයෙනි රහස අන්‍යයන්ට හෙළි කරති. ලාභ සත්කාරවලට ගිජු ආත්මාර්ථකාමී පුද්ගලයෝ ද එසේමය. තවත් කෙනෙකුගෙන් ලැබෙන වාසිය සලකා ඔවුහු කවරාකාර වුවද පාවාදීම් කරති. රහස් හෙළි කරන අනෙක් පුද්ගලයා නම් ස්ත්‍රීන්ගේ වශගයට ගිය තැනැත්තාය. සංස්ථා හා ආයතන ප්‍රධානීන් ලෙස දේශපාලන නීති ආරක්ෂක ආදී විවිධ තරාතිරම්වල නියුතු පුද්ගලයන් ස්වකීය තනතුරු ආත්මගරුත්වය ආදී කිසිවක් නොසලකා ස්ත්‍රීන්ගේ වශගයට පත්ව සාහසික භූමිකාවන් රඟපාන අයුරු ඔබ දක ඇත.[11] එබඳු තත්වයක් යටතේ එවැනි පුද්ගලයෙකුගෙන් රහසක සුරක්ෂිතතාව අපේක්ෂා කළ නොහැකිය. ඇතැම් පුද්ගලයන් කවරාකාර පහත් ක්‍රියාවක් වුවද මත්පැන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් සිදු කිරීම මනුෂ්‍ය සමාජයේ ප්‍රකට අත්දැකීමකි.

රහස පිළිබඳ බෞද්ධ මතය හඳුනා ගැනීමට **උම්මග්ග ජාතක**යේ ඇතුළත් පහත දැක්වෙන ප්‍රකාශය වැදගත් වේ.

> "මහරජ රහස් නම් දෙය සැඟවීම ම යහපත. නුවණැත්තෝ රහස් ප්‍රකාශ කිරීම උතුමැයි නො කියන්නාහ. යම්තාක් තමා සිතු දෙය මුදුන් නොපැමිණියේ නම් ඒතාක්ම නිධානයක් මෙන් නුවණැත්තේ ඉවසන්නේය. නිෂ්පන්න වූ අර්ථ ඇත්තේ කැමති පරිද්දෙන් ප්‍රකාශ කරන්නේය.[12]

**උම්මග්ග ජාතක**යේ සේනකාදී පඬිවරුන් සිවු දෙනා විසින් කියන ලද රහසක් කිවයුතු පුද්ගලයන් සියලු දෙනා මහෞෂධ පණ්ඩිතයන්ගේ අත්දැකීම් අනුව ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එසේම එහි අනාරක්ෂිත බව සාක්ෂි සහිතව තහවුරු කෙරේ. රහසක් නම් එය සැඟවිය යුතු බවත් රහස් කීම නුවණැත්තන් විසින් අනුමත නොකරන ලද්දක් බවත් පෙන්වා දේ. ඉතා සංක්ෂෙපයෙන් කිවහොත් රහස යන්නෙහි අරුතම සැඟවිය යුතු බවය. මේ නිසා සාමාජික චරණයන්හි දී රහස පෞද්ගලික අද්දැකීමක් වීම වඩාත් යෝග්‍ය වේ.

## රහසේ දාර්ශනික පදනම

රහස වූකලී ආරක්ෂා කළ යුතු යමකි. යමක් රැකීම වරදක් නොවේ. ආගමික සන්දර්භයේ දී වුවද පොදු සමාජයෙන් ආරක්ෂා කළ යුතු යම් යම් දේ පවතී. මෙයට සුදුසුම උදාහරණය අපට උපනිෂද් සාහිත්‍යයෙන් හමුවේ. බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දියුණු අවස්ථාවක් වන උපනිෂද්වල **ගුහ්‍ය** හෙවත් සැඟවිය යුතු යැයි සැලකෙන ඉගැන්වීම් සමුදායක් පිළිබඳව ඉගැන්වේ. එහි **ගුහ්‍ය සූත්‍ර** යැයි විශේෂ සූත්‍ර විශේෂයක්

ද ඇත. සැබැවින්ම **උපනිෂද්** යන වචනයේ තේරුම වුවද සමීපයේ හිඳ උගතයුතු දේ යන්නයි. උපනිෂද් ඉගැන්වීම් කීකරු හොඳම ශිෂ්‍යයාට ඉගැන්වීම සිරිතයි. එය එසේ උගන්වනු ලබන්නේ නරක දෙයක් ආරක්ෂා කිරීම සඳහා නොව වැදගත් දේ වැදගත් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාව මතය. බුද්ධධර්මයේ වුවද මෙම අවදානම විතමන් යුගයේ දී අපි දකිමු. අනවශ්‍ය පුද්ගලයන් සාම්ප්‍රදායික ඉගැන්වීම් හා සාම්ප්‍රදායික අධ්‍යයන ක්‍රමවේද වන **අටුවා ටීකා ටිප්පනී** හැදෑරීමකින් තොරව හිතුමතේ විවරණය කරන අයුරු අපට දක්නට ලැබේ. මෙය සැබැවින්ම ඛේදවාචකයකි. මේ නිසා ආරක්ෂා කළයුතු යමක් වේ නම් එය සුදුස්සන් වෙතම භාරවිය යුතුය. යම් යම් ඉගැන්වීම්වල ගුප්තමය බවක් පැවතීම සමාජගත අත්දැකීමකි. **ගුරුමුෂ්ටි** යනුවෙන් පොදු ව්‍යවහාරයෙහි මෙය හැඳින්වේ. ගුරුවරයාගේ අභ්‍යන්තරයෙහි ක්‍රියාත්මක වන ගුඪ ස්වභාවයක් නිසා මෙකී **ගුරුමුෂ්ටි** නම් රහස්‍ය ඉගැන්වීම් අර්ථ ගැන්වීම නිවැරදි නැත. මෙහි දාර්ශනික පසුබිම තේරුම් ගැනීමට බුදුදහමෙහිම එක් ඉගැන්වීම් හෝ ආගමික අංගයක් වන වජ්‍රයානය පිළිබඳ දාර්ශනික පැතිකඩ හැදෑරීම සුදුසුය. එහි මන්ත්‍රභාවිතයත් සංකේත භාවිතයත් පුද පූජා හා චාරිත්‍රවාරිත්‍ර විධිත් පවතින අතර ගුප්ත ස්වභාවය ද වැදගත් කරුණකි. සැබැවින්ම ආගමික ප්‍රස්තුතවල ගුප්තමය හෝ රහස්‍යමය බවක් පවත්වාගෙන යනුයේ ඒවා බොහෝ දෙනෙකුගේ මනසට අවිෂය හෝ නුසුදුසු වන හෙයිනි. අපවිත්‍ර අභිප්‍රායයන්ගෙන් යුතු පුද්ගලයන් අතට පත්වුහොත් ඒවායින් තමාට මෙන්ම අනුන්ට ද විපත් පැමිණේ. යමෙකුගේ සිත දුක අවබෝධ කිරීම, අනිත්‍යතාව ප්‍රගුණ කිරීම, මෛත්‍රිය කරුණාව පරාර්ථචරියාව වැනි ගුණාංගවලින් පෝෂණය වී නැති නම් ඔහුට වජ්‍රයාන බුදුසමයේ ඉගැන්වෙන **මන්ත්‍රයාන ප්‍රතිපදාව** හානිකර වේ යැයි පිළිගැනේ. ඊට හේතුව ඔහුට ඔරොත්තු නොදෙන ප්‍රතිපදාවක් ඔහු විසින් පටන්ගෙන ඇති බැවිනි. එබැවින් මන්ත්‍රයානය විවෘතව බෙදා හැරීම තහනම් වේ. එසේම මෙම ප්‍රතිපදාව පුරණ අය විසින් එය නුසුදුසු අයට ලබා නොදීමට වග බලා ගත යුතුය.

වජ්‍රයානයේ **රහස් භාෂාවක්** මෙන්ම **රහස් සංකේත** ද භාවිත කෙරේ. එය එම ප්‍රතිපදාව පිරීමෙහි උසස් තත්වයකට පැමිණියවුන් විසින් යොදා ගැනේ. එකී රහස් භාෂාව හඳුන්වා ඇත්තේ **සන්ධ්‍යාභාෂා** යනුවෙනි. සන්ධ්‍යාව දහවල් කාලයට හෝ රාත්‍රී කාලයට අයත් නොවන ඒ දෙක අතරමැද පවතින කාලයකි. සමාජ සම්මත අර්ථවලට අයත් නොවන එහෙත් එයින් පරිබාහිර ද නොවන අර්ථ කුළු ගැන්වෙන භාෂාවක් වන හෙයින් මෙකී රහස් භාෂාව **සන්ධ්‍යා භාෂා** නමින් හැඳින්වෙන්නට ඇතැයි යන්න උගතුන්ගේ මතයකි. වජ්‍රයානයෙහි සංකේත භාවිතය තුළ ද කිසියම් ප්‍රමාණයක රහස්‍යතාව ආරක්ෂා කර ගැනීමක් ගැබ්වන බව සිතීම වැරදි නොවේ යැයි හැඟේ. කුමක් නිසාද යත් සන්නිවේදනයේ රහස්‍යභාවයක් එයින් තහවුරු වන හෙයිනි. ථේරවාද සම්ප්‍රදායෙහි ද **නෙය්‍යාර්ථ** හා **නීතාර්ථ සූත්‍ර** දේශනාවල මෙම සැඟවුණු අර්ථ ක්‍රියාකාරිත්වය පවතී. මෙම **නෙය්‍යාර්ථ නීතාර්ථ** ක්‍රම හඳුනා නො ගෙන බුද්ධවචනය විග්‍රහ කිරීමෙන් හානි පැමිණෙන බව මුල් බුදුසමයෙහි පිළිගැනේ.[13]

වජ්‍රයාන බුදුසමයෙහි ස්ත්‍රී පුරුෂ සම්භෝගය, කඳින් වෙන් කළ ශීර්ෂ, ස්ත්‍රී රූප සමග මළමිනී, හිරු සඳු, පියුම් සමග ලේ මස් ඇට යනාදිය ද, මළමිනී පාගාගෙන සිටින දේවරූප, දෙවඟනන්, වජ්‍රායුධය, ඝණ්ඨාව, පුරුෂලිංගය යනාදි අනේකවිධ සංකේත අදහස් සන්නිවේදනය කිරීම සඳහා භාවිත කෙරේ.

මේවා හැමෙකෙකින්ම අර්ථවත් කෙරෙන ආගමික අදහසක් ඇත. ලෝකය පිළිබඳව හෝ සත්වයා පිළිබඳව හෝ සදාචාරය පිළිබඳව කිසියම් ආගමික අදහසක් මෙයින් සංකේතවත් වේ. නිදසුනක් ලෙස **පියකරු කාන්තා රූපයක් සමඟ මළමිනියක් දැක්වීම** සංකේතවත් කරනුයේ ආශාව හා **ද්වේෂයයි**. නැතහොත් ඇලීම හා ගැටීමයි. ප්‍රතිවිරුද්ධ ධර්මතා දෙකක් එක්තැනක දැක්වීමෙන් අදහස් කෙරෙනුයේ එම ප්‍රතිවිරුද්ධ ධර්මතා ඉක්මවා ගිය ඒකත්වයයි. සංයමයක් නොමැති පුද්ගලයන් අතට මෙබඳු ඉගැන්වීම් පත් වූ කල්හි විෂමාර්ථ ජනනය කළ හැකි ය. ඔහු එයට වැරදි අර්ථකථන සැපයීමට පෙළඹේ. එබැවින් එහි අර්ථ ගම්භීරත්වය රැකීමට යහපත් ශික්ෂිත පුද්ගලයන් අතටම එය යා යුතුය. වජ්‍රයානයේ මෙන්ම අනෙකුත් නොයෙක් ආගම් සම්බන්ධයෙන් පවතින රහස්‍ය ඉගැන්වීම්වල ප්‍රායෝගික උවමනාව මෙයයි.

## රහෝවාසය සහ ආගමික චරණය

ධර්මය පුරුදු පුහුණු කිරීමේ දී ද රහසිගතභාවය යම් පමණකට ක්‍රියාත්මක වේ. එය රහසිගත බවකට වඩා හුදෙකලා බව යන අරුතින් පෙළෙහි දක්වා ඇත. සාමාජික ජීවිතයේ දී අපට රහසිගත සැඟවිය යුතු දේ ඇතත් ධර්මානුකූලව සැලකීමේ දී මෙකී සමාජගත අර්ථයෙන් කියැවෙන රහසෙහි ධර්මමය හෝ යථාර්ථමය වටිනාකමක් නැත. කුමක් නිසාද යත්, සදාතනික රහස් ලෝකයේ නැති බැවිනි. රහසේ දාර්ශනික වටිනාකම යනුවෙන් ඉහත සාකච්ඡා කළ ආගම්වල ගුප්තමය වශයෙන් ආරක්ෂා කෙරෙන දැහි රහස්‍යභාවය පවතින්නේ එහි ඵලය අත්පත් කර ගැනීම දක්වා පමණකි. ඉන් පසු එය රහසක් වශයෙන් නොපවතී. එබැවින්ම රහස යන පදයෙන් ධර්මයේ කියැවෙන අදහස සමාජගත අර්ථයෙන් තේරුම් නොගත යුතුය. '**නත්ථි ලොකෙ රහො නාම**'[14] (ලෝකයේ රහස් නම් දෙයක් නැත.) යැයි වරක් බුදුන් වහන්සේ වදාළේ එහෙයිනි.

**සංයුත්ත නිකායේ** රහොගත නමින් සූත්‍රයක් වේ.[15] එක්තරා භික්ෂුවක් දිනක් බුදුරදුන් වෙත එළඹ මෙසේ කීය.

> "ස්වාමීනි, රහෝගතව ප්‍රතිසංලයනව සිටි මට මෙබඳු සිතක් ඇති විය. භාග්‍යවතුන් වහන්සේ විසින් සුඛ වේදනා, දුක්ඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා යනුවෙන් වේදනා තුනක් ගැන වදාරන ලදී. මෙය ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. එනම් යම්කිසි වේදයිතයක් වේ ද එය දුකෙහිම වේ. මෙය බුදුරදුන් විසින් කුමක් සඳහා දෙසන ලදද යනුවෙනි."

මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ හුදෙකලාව, අප්‍රකටව විසීම, ගැඹුරු චින්තනයන්ට පදනමක් වන බවයි. මෙයටම සම්බන්ධ වන තවත් වැදගත් චර්යා ලක්ෂණයක් වේ. එය නම් **ප්‍රකර්ෂ විවේකයයි**. වර්තමානයේ ඇතැම්විට නිහඬ මිනිසුන්ගේ අප්‍රකට චරණය නිර්දය ලෙස ගරහනු ලබන අවස්ථා අප කොතෙකුත් දකිමු. එතෙකුදු වුවත් නිහඬ අප්‍රකට වාසය වූකලී උත්තුංග පුරුෂ ලක්ෂණයක්ම වේ. ඒ අන් කිසි කරුණක් නිසා නොව කුහක වංචනික අධ්‍යාත්මයකින් තොරව නිහඬව හා අප්‍රකටව සිටින එබඳු පුරුෂයන් සිය කාලය උසස් චින්තනයන් ඔස්සේ උසස් භාවිකත්වයකට හරවන හෙයිනි. වෙනත් විධියකින් කිවහොත් අධ්‍යාත්මික වින්දනයක් ඔවුන් ලබන හෙයිනි. එය සමස්තයාගේ හිතසුව පිණිස වන කැපකිරීමක්

වන හෙයිනි. **මජ්ඣිමනිකායේ** මහාසීහනාද සූත්‍රයේ බුදුහු තමන් වහන්සේ බෝධිසත්ත්ව අවධියේ දුෂ්කර ක්‍රියා කරමින් ප්‍රකර්ෂ විවේකය වැඩූ අයුරු මෙසේ වදාරති.

"ශාරිපුත්‍රය, මෙය මාගේ උසස් විවේක බව වේ. ශාරිපුත්‍රය, ඒ මම එක්තරා වනයකට වැද වෙසෙමි. යම් විටක ගොපල්ලෙකු හෝ අවශෙෂ සිවුපාවුන් රකින්නෙකු හෝ තණ ගෙන යන්නෙකු හෝ දර ගෙන යන්නෙකු හෝ වනයේ කටයුතු කරන්නෙකු හෝ දකිම් ද, එවිට මමඃ සිටි වනයෙන් අන් වනයකට ද ලැහැබින් ලැහැබට ද බෑවුමෙන් බෑවුමට ද ගොඩින් ගොඩට ද පනිමි. ඊට හේතු කවරේද යත් ඔවුහු මා නො දකිත්වා, මම ද ඔවුන් නොදකිම්වා කියා සිතාගෙනය. ශාරිපුත්‍රය, යම්සේ වනවැසි මුවෙක් මිනිසුන් දැක වනයෙන් වනයට ලැහැබින් ලැහැබට බෑවුමෙන් බෑවුමට ගොස් පනින්නේ ද එමෙන් මම ද ගොපල්ලෙකු හෝ අවශෙෂ සිවුපාවුන් රකින්නෙකු හෝ තණ ගෙන යන්නෙකු හෝ, දර ගෙන යන්නෙකු හෝ වනයේ කටයුතු කරන්නෙකු හෝ දකිම් ද, එවිට මමඃ සිටි වනයෙන් අන් වනයකට ද ලැහැබින් ලැහැබට ද බෑවුමෙන් බෑවුමට ද ගොඩින් ගොඩට ද පනිමි. ඊට හේතු කවරේද? ඔහු මා නො දකිත්වා, මම ද ඔවුන් නො දකිම්වා කියා සිතාගෙනයඃ ශාරිපුත්‍රය, මෙය උසස් විවේක ඇති බව වෙයි." [16]

බෞද්ධ සන්දර්භයේ දී **රහෝවාසය** හෙවත් රහස් විසීම නැතහොත් හුදෙකලා වාසය පෙර කළ පින් ඇති පුද්ගලයෙකුට වඩාත් හුරුපුරුදු සහ ඵලදායක ක්‍රියාවලියක් වේ, මෙබඳු වාසයක් සමාජයේ සෑම කෙනෙකුටම කළ නො හැකිය. ඇරිස්ටොටල් වරක් ප්‍රකාශ කළේ සමාජ ජීවිතයක් අවශ්‍ය නොවන යමෙක් වේ නම් ඔහු එක්කෝ තිරිසනෙක් විය යුතුය, නැත්නම් දෙවියෙකු විය යුතුය යනුවෙනි. මෙයින් අදහස් වන්නේ පිරිහීම හෝ දියුණුව යන දෙකටම හුදෙකලා වාසය බලපාන බවයි. මත්කුඩු වැනි දේ පාවිච්චි කළ පහත් පුද්ගලයන් දියුණු නොදියුණු සියලු රටවල මංමාවත්වල මධ්‍යම රාත්‍රියේ පවා හුදකලාව සිටින අවස්ථා ඔබ දැක ඇත. උන්මත්තකයන් අහස පොළොව එකතු කරන්නට මෙන් කල්පනාවේ නිමග්නව තනිවම සිටිනු ඔබ දැක ඇත. ඔවුන්ට පරමාදර්ශී පුද්ගලයන් විය නො හැකිය. එහෙත් බුදුන් රහතුන් වැනි උතුමන් ශ්‍රේෂ්ඨ කවියන් දාර්ශනිකයන් වැනි අය හුදකලාව විසූයේ එබඳු තත්වයක් නිසා නොව පරමාදර්ශී අරමුණු විධිමත් ලෙස සාක්ෂාත් කර ගැනීමේ ක්‍රමවේදයක් වශයෙනි. විභාගයකට සූදානම් වන ශිෂ්‍යයෙකු දෙස බලන්න. ඔහු හෝ ඇය එම කාල සීමාව තුළ සංකීර්ණ සමාජයෙන් තරමක් හෝ ඉවත්ව හැකි තරම් හුදකලා වී එකී හුදකලාවේ විශිෂ්ට ඵලාපේක්ෂාවෙන් හිස ගිනිගත්තාක් මෙන් ක්‍රියා කරනු ඔබ දැක ඇත. මෙයින් පෙනෙනුයේ හුදකලා වීම අපහසු එහෙත් ඵලදායක කාර්යයක් බවයි.

සාමාජික චරණය මිනිසෙකුට අත්‍යවශ්‍යම දෙයක් බව බුදුදහම එකහෙළා පිළිගනී. ඡන්න භික්ෂුව ආශ්‍රයෙන් ඉවත්කොට (බ්‍රහ්මදණ්ඩනය)[17] තැබීමට බුදුරදුන් විසින් නියම කළ අවස්ථාවේ එම භික්ෂුව සිහිසුන්ව ඇද වැටුණු බව දක්වා තිබීම මෙයට කදිම නිදසුනකි. එයින් අදහස් කෙරෙනුයේ රහෝගත වාසය පුහුදුන් මිනිසාට ලෙහෙසි පහසු ක්‍රියාවක් නොවන බවයි. එහෙත් අවශ්‍ය නම් කෘතපුණ්‍යවත් ධෛර්ය සම්පන්න කුලපුත්‍රයෙකුට මෙබඳු හුදෙකලා වාසයක් කළ හැකි බව බුදුදහම පිළිගනී. කමටහන්

ගෙන හුදකලාව බවුන් වැඩූ ශ්‍රාවකයන් ගැන ථේරවාද මහායාන උභය සම්ප්‍රදායන්හිම බොහෝ සෙයින් සඳහන් වේ. එහි තේරුම අප දන්නා කාටත් හොරෙන් කටයුතු කිරීම යන්නට වඩා පුළුල් වූවකි. එහෙයින් රහස යන පදයෙහි ගැඹුරු අරුතක් ඇති බවත් එය එකහෙළා පිරිහෙළා කථා කිරීමට පෙර විමසා බැලිය යුත්තක් බවත් හුදකලාව විවික්ත වාසයෙන් යුතු පුද්ගලයන් නිහඬව උත්තරීතර සමාජ ආගමික මෙහෙවරක යෙදෙන උතුම් මනුෂ්‍ය කොටසක් ලෙස බුහුමන් දැක්විය යුත්තන් බවද ලෞකික අලෞකික ක්‍රියාකාරකම් විෂයෙහි මෙකී රහෝවාසයෙන් යුතු චරණය පුරුදු පුහුණු කළ යුත්තක් බව ද මෙහිලා අවධාරණය වේ.

## ආන්තික සටහන්

---

1 **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය**, (1970), සෝරත හිමි, වැලිවිටියේ, 838 පිට
2 **සිංහල පාලි ශබ්දකෝෂය**, (1969), සිරි සුමංගල හිමි, මඩිතියවෙල , 423 පිට
3 -එම-
4 **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය**, (1984), විජයතුංග, හරිශ්චන්ද්‍ර, 1413 පිට
5 **පාලි සිංහල අකාරාදිය**, (1960), බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ, 411 පිට
6 **සංස්කෘත ශබ්දාර්ණවය**, (1999), සෝරත නාහිමි, වැලිවිටියේ, 477 පිට
7 ජාතක පොතෙහි 61 වන ජාතකය බලන්න.
8 **මිලින්දපඤ්හො**, 92 පිට
9 -එම-
10 -එම-
11 -එම-
12. **පන්සිය පණස් ජාතක පොත් වහන්සේ**, (2009), ප්‍රකාශය සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1758 පිට බලන්න.
13 නීතත්ථසුත්ත, **අංගුත්තරනිකාය**, දුකනිපාත , 3 7 බලන්න.
14 **අංගුත්තරනිකාය**, තිකනිපාතය, ආධිපතෙය්‍යසුත්ත බලන්න.
15 **සංයුත්තනිකාය**, 36 2
16 **මජ්ඣිමනිකාය**, 1 11 බලන්න.
17 චුල්ලවග්ගපාළි, පඤ්චසතිකක්ඛන්ධකය බලන්න.

**මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**
(රාජකීය පණ්ඩිත, B.A. (Hons), M.A. (Kel.), M.A. (BPU), Phd, (Delhi).
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය